## මගෙන් වචනයක්..

උසස් පෙලට ඔයා මීඩියා තෝරගන්න හේතු සැහෙන්න ඇති.ආසම සබ්ජෙක්ට් එක නිසා,ඉසෙඩ් එක වැඩි,ලේසි නිසා,යාලුවා කරන නිසා,එයා කරන නිසා,ගෙදරින් කිව්ව නිසා ඔය වගෙ හේතු ඇති.

ඒ මොන හේතුව තිබුනත් පොඩ්ඩො ඔයා විභාගෙට හොද ලකුණක් දාන්නම ඕනි.ඔයාට මොන හේතුවක් තිබ්බත් ඔයාගෙ දෙමව්පිය-න්ට තියෙන්නෙ එක හේතුවයි.ඒ මගෙ දුව මගෙ පුතා හොද තැනකට ඒවි කියන බලා-පොරොත්තුව විතරයි.ඒ බලාපොරොත්තුවත් හේතුවත් ඉශ්ඨ කරගෙන ඔයාගෙ හීනත් ඉශ්ඨ කරගෙන ඔයා විභාගේ ඉහලින්ම සමත් වෙන්න ඕනි.

ජයග්‍රහණය නෙමෙ සහභාගි වීම වැදගත් කියන තර්කෙට වැඩ කරන්නෙපා.සහභාගි වෙලා ෆේල් ලකුනක් අරන් වැඩක් නෑ.හැමෝම හිනාවෙයි.ඉතින් සහභාගි වෙලා ජයග්‍රහණය අරන් පෙන්නන්න.අඩුම උත්සහා කරන්න.

ඔයාට ජයෙන් ජය පොඩ්ඩො.!!

Design by - Creativepixel.lk - Search us on fb/insta

Advanced level 2023
# මීඩියා
COMMUNICATION & MEDIA STUDIES
මොළේටම නිතටම මීඩියා



හය වැනි පාඩම

# මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය බලපෑම

Cultural Understanding Media Nature and Influence

විස්තරාත්මක කෙටිසටහන් පොත

Advanced level 2023
මීඩියා
COMMUNICATION & MEDIA STUDIES
මොළේටම නිතටම මීඩියා

විස්තරාත්මක කෙටිසටහන් පොත

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්
ලහිරු කේ. මදුශාන්
HNDIT , mass communication (UG)
076 3950730
071 0538308

**6 විකෘතිකරණය**

සන්නිවේදන විකෘතිය විකෘතිකරණය නමින් හැඳින් වේ එක් පාර්ශ්වයක් විසින් වෙනත් පාර්ශ්වයකට ගෙන යනු ලබන නාලිකා හෝ විවිධ ආකාරයේ මැදිහත්වීම් වලින් සන්දේශයවිකෘති කිරීම් වලට ලක්වේ.

**7 සඵලත්වය**

අපේක්ෂිත ප්‍රතිඵල ඉදිරිපත් කිරීමේ දී කිසියම් සාර්ථකත්-වයක් ලගා කර ගැනීම සන්දේශයේ ගුණාත්මක භාවය නිෂ්පාදන ගුණත්වය සහ ඵීත්තු ගැන්වීම මගින් ප්‍රවෘත්ති ප්‍රකාශනයේ සඵලතාව ඇති වේ.

ඵලදායි සන්දේශයක් සඳහා ප්‍රධාන ගුණාංග කිහිපයකි.

**සරලබව**
**විශේෂත්වය**
**ව්‍යුහය**
**ඇලීම**

**8 ශූර මෙහෙයවීම**.

විශේෂිත අවශ්‍යතාවයන්ට අනුකූල වන ප්‍රතිරූපය-න් හෝ තර්කයන් නිර්මාණය කරන සම්බන්ධ මාලා-වකි සන්දේශයක ශූර මෙහෙයවීමට සන්දේශයේ අංග වෙනස් කිරීමට බලපාන ප්‍රාථමික සංරචක පහන පරිදි වේ.

**ප්‍රමාණය**
**ගුණාත්මකභාවය**
**සම්බන්ධතාව**
**ආකාරය**

**9 ඒකාකෘතිබව**

සියලුම සමාජිකයන්ට නිතරම යෙදෙන සමූහයක ස්ථා-වර මානසික ස්වරූපයකි.

**10 ඇගයීම**

**කුසලතා කට්ටලයක් පමණක් නොව අත්දැකීම් පිළිබඳ ආකල්පයකි**.එය සාමාන්‍යයෙන් නිශ්චිතව යමක් සිදු කරන රහස් පරීක්ෂණයකි.ඒ අනුව විශ්ලේෂණය මගින් ප්‍රශ්න වලට පිළිතුරු සපයයි.මාධ්‍ය සන්දේශ යනු කුමක්ද? වඩාත්ම කැමැති කුමන සන්දේශයකටද? ඒ මන්ද? මාධ්‍යයෙන් ලැබෙන තොරතුරු හොඳද?


**ලහිරු කේ. මදුශාන්**
**Lahiru K - Media Stu**
**Search us on fb / youtube / insta and tiktok**


# මාධ්‍ය සාක්ෂරතාව හදුනා ගැනීම

සාක්ෂරතාව යන අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාවයි

**- ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය -**

පුළුල් අර්ථයෙන් ගත් කළ සාක්ෂරතාවය යනු මුද්‍රිත හා ලිඛිත ද්‍රව්‍ය භාවිත කරමින් සංකීර්ණ පාඨ හදුනා ගැනීමට අවබෝධ කර ගැනීමට අර්ථකථනය කර ගැනීමට නිර්මාණය කිරීමට සන්නිවේදනය කිරීමට සහ සංඛ්‍යාංකනය කර ගැනීමට ඇති හැකියාවයි.

**- යුනෙස්කෝ සංවිධානය**

පැරැණි කාලයේ සාක්ෂරතාවය යනුවෙන් හඳුන්වනු ලැබුවේ ශූර කථිකත්වයයි.

ලිඛිත මාධ්‍ය වර්ධනයෙන් පසුව අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාව ලෙසත් සාක්ෂරතාව හඳුන්වා ඇත.

**දෘශ්‍ය සාක්ෂරතාවය**
**ශ්‍රව්‍ය සාක්ෂරතාවය**
**පරිගණක සාක්ෂරතාවය**
**තොරතුරු සාක්ෂරතාවය**
**තාක්ෂණ සාක්ෂරතාවය**
**සංඛ්‍යාංක සාක්ෂරතාවය** ලෙස සාක්ෂරතාවය වර්ග කළ හැකිය.

# මාධ්‍ය සාක්ෂරතාවය

ජනමාධ්‍ය මගින් ඉදිරිපත් වන විවිධ සන්දේශ කිය-වා වටහා ගැනීමටත් ඒවා භාවිතාකිරීමටත් පවතින හැකියාව නිපුණතාව හා දැනුමයි.

මාධ්‍ය සාක්ෂරතාවය විෂයක් ලෙස බිහිවීමට පසුබිම සකස් වන්නේ ජනමාධ්‍ය ව්‍යාප්තවීමේ ප්‍රතිපලයක් වශ-යෙනි.

# මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳව නිර්වචන

**ඩබ්ලිව් ජේම්ස් පොටර්** * **1998**

අප වෙන ලැබෙන මාධ්‍ය සන්දේශ අර්ථකථනය කර ගැනීමට හා අප කෙතරම් දුරට මාධ්‍යයට විවෘත ද යන්න පිළිබඳ පර්යාලෝකනය මාධ්‍ය සාක්ෂරතනාවයයි අප විසින් පර්යාලෝක ගොඩනගා ගනු ලබන්නේ අපගේ දැනුම් ව්‍යුහයන් මතයි.

**යුරෝපා කොමිසම**

මාධ්‍ය සෘක්ෂරතාවය යනු මාධ්‍යයෙන් සෑම ආකාරයකින්ම ඉදිරිපත් කරන සන්දේශ පරිහණය කිරීමට විශ්ලේෂණය කිරීමට ඇගයුම් කිරීමට හා නිර්මා-ණය කිරීමට ලබා ගන්නා හැකියාවයි.

**ජාතික මාධ්‍ය සාක්ෂරතාව සඳහා ජාතික ආයතනය ඇමෙරිකාව**

මාධ්‍ය සාක්ෂරතාවය යනු මාධ්‍යයන්ට ප්‍රවේශවීම මාධ්‍යයන් විශ්ලේෂණය මාධ්‍යයන් ඇගයීම මාධ්‍ය නිර්මාණ සහ මාධ්‍යයන් තුළ ක්‍රියාශීලීව කටයුතු කිරීමේ සමත් බවය.

**මාධ්‍ය සාක්ෂරතා අධ්‍යයනය යනු**

මාධ්‍ය සන්දේශ ක්‍රියාවලිය හඳුනා ගැනීමේ හැකියාව ,මාධ්‍ය සන්දේශයන්හි බලපෑම හඳුනා ගැනීමේ හැකියාව, මාධ්‍යය සන්දේශ විශ්ලේෂණය කිරීමේ හා ඒ සම්බන්ධ කථිකාවනක් ගොඩනැගීමේ හැකියාව, මාධ්‍ය සන්දේශ සංජානනය කිරීමේ හැකියාව, මාධ්‍ය සන්දේශ ඇගයීමේ හැකියාව යන **අංශ පිළිබඳව ඉගෙන ගැනීමයි**.

මාධ්‍ය සන්දේශ විචාරශීලී චින්තනයෙන් යුතුව වටහා ගැනීමටත්, ස්වකීය සන්දේශ නිර්මාණය කර ගැනීම සඳහා මාධ්‍ය භාවිත කිරීමත් පිළිබඳ ඉගැන්වීමයි. එය විසිඑක් වන සියවසේ කුසලතාවයයි.

**මාධ්‍ය සාක්ෂරතාවයේ තෙවැදෑරුම් සිද්ධාන්ත**

ස්වකේන්ද්‍රය / ස්වපථය
ඥාන ව්‍යුහ
කුසලතා

## ස්වකේන්ද්‍රය / ස්වපථය

ස්වකේන්ද්‍රය සෑදී ඇත්තේ තමන් ගමන් කරවන තම ඉලක්ක ඇසුරිනි. තම ඉලක්ක නැතහොත් අරමුණු මගින් තමන්ට තොරතුරු සැපයේ.

මෙය **විඥානිකව හෝ අවිඥානිකව** ක්‍රියාත්මක වේ.

ස්වකේන්ද්‍රය විඥානිකව ක්‍රියාත්මක වන විට තමන්ගේ තෝරා ගැනීමේ බලය වැඩිවී තීරණ ගැනීම පහසු කරයි.

ස්වකේන්ද්‍රය අවිඥානිකව ක්‍රියාත්මක වන විට තමා ගන්නා තීරණ හා නිගමන පාලනය කිරීමට තමන්ට නොහැකි අතර තමාගේ සම්පූර්ණ අනුදැනුමකින් තොරව යම් යම් තිරණ වලට යටත් විමට නොහොත් වහල් විමට සිදුවේ.

## ඥාන ව්‍යුහ

පුද්ගල මනස තුළ තැන්පත් වී ඇති සැකසුනු තොරතුරු කට්ටලයකි. ඥාන ව්‍යුහයන් ස්වයං සිද්ධව නැතහොත් අහම්බෙන් උරුම නොවන අතර ඒවා සැලකිල්ලෙන් ඉතා නිවැරදිව ගොඩනගා ගත යුතුය. **ඥාන ව්‍යුහවල ඇත්තේ සාමාන්‍ය කරුණු පමණක්ම නොව ඒවා ගොඩනැගෙන්නේ එක්තරා සැලැස්මකට අනුව යම් යම් තොරතුරු තෝරා බේරා ගැනීමෙනි**.



**05 නිගමනය කිරීම**.

මාධ්‍ය සන්දේශයෙහි පොදු තත්වයක් ඇසුරින් විශේෂිත යමක් නිගමනය කිරීම.
පොදු කරුණු උපයොගී කර ගෙන විශේෂ දෙයක් පැහැදිලි කිරීමට උත්සහ ගනු ලබයි.

**06 සංස්ලේෂණය**

මාධා සන්දේශ සමස්තයට ගළපමින් නව ප්‍රස්තුතයක් ගොඩ නැගීම තිබෙන කොටස් එකතු කර අලුත් ව්‍යුහයක් ගොඩනගා ගැනීම සිදු කරයි.

**07 වියුක්තිකරණය**

මාධ්‍ය සන්දේශයෙහි හරය සහ වැදගත් කරුණු ඉතා කෙටියෙන් පැහදිලි කිරීම.
තොරතුරක අඩංගු හරය නිරවුල්ව පැහැදිලිව කෙටියෙන් සම්පිණ්ඩණය කිරීමයි.

**මාධ්‍ය සන්දේශයක් විශ්ලේෂණය කිරීමේ මූලික කරුණු**

**1 අර්ථය**

සෘජු ප්‍රකාශිත නොවන යමක් පිළිබඳව පැහැදිළිව සන්නිවේදනය කිරීමයි එනම් එය වචනයක් පාඨයක් සංකල්පයක් හෝ ක්‍රියාවක අදහස කියා පෑමයි.

**2 අදාලත්වය**

සන්දේශයට අදාල අන්තර්ගතයේ ද ඊට අදාල අනුක්‍රමය සමබරතාව සුසංයෝගය හා ප්‍රමාණාත්මක බව මනාලෙස ගැළපීම.

**3 අභිප්‍රේරණය**

මාධ්‍ය මගින් පුද්ගල විශ්වාසයන් ආකල්ප අභිප්‍රාය හෝ හැසිරීම කෙරෙහි බලපෑම ඇතිකර පිළිගැනීමට යටත් කිරීමයි මෙහි මාන **තුනකි**.

**ආකල්ප වෙනස් කිරීම**
**හැසිරීම් වෙනස් කිරීම**
**කාලයත් සමග වෙනස් කිරීම**

**4 පක්ෂපාතීත්වය**.

යම් ආකාරයක ඒ පුද්ගලයකුට හෝ කණ්ඩායමකට විශේෂත්වයක් දැක්වීමයි.

**5 විශ්වසනීයත්වය**

මූලාශ්‍රයේ විශ්වසනීයත්වයට දැනුම ලෙස අධ්‍යාපනය හා අත්දැකීම්ද හැකියාව ලෙස භෞතික හා මානසික සාධක ද ඇතුළත් වේ.

සන්නිවේදකයා නව විශ්වාසයන් ලබා දුන්නද ලබන්නා විශ්වාස නොකරන්නේ නම් එය ප්‍රතික්ෂේප වේ එසේම බහුමානි ලෙස විශ්වසනියත්වය හට ගනියි.

**විශ්වසනීයත්වය සඳහා වූ මාන**
**ප්‍රාථමික මාන**
**ද්විතීක මාන**

ග්‍රාහක නිර්මාණ ජනමාධ්‍යයන්ට ලබාදීමේ අභියෝග ජය ගැනීම.
මාධ්‍යයේ පිටුපස නිබෙන නොයෙකුත් බලවේග පිළිබඳව දැනුවත් වීම.

ස්ත්‍රීපුරුෂභාවය ජාතිය වර්ගය කුලය ලිංගිකත්වය යනාදිය ජනමාධ්‍ය මගින් ප්‍රතිනිර්මාණය වීම පිළිබඳව හැදෑරීම.

විවිධ ජනමාධ්‍ය දෙස විචාරශීලීව බැලීම හා ඒවා පිටු- පස සිටින අදෘශ්‍යමාන බලවේග හඳුනා ගැනීම.

තමා කළ යුතු දේ සිතිය යුතු දේ නොසිතිය යුතු දේ පිළිබඳව විචාරශීලීව කල්පනා කිරීමේ හැකියාව.

විචාරශීලී ග්‍රාහකත්වය හා මාධ්‍ය සාක්ෂරතාවය සෑම පුරවැසියෙකුම බල ගන්වයි.

ජනමාධ්‍ය තුළින් මවන මායාකාරී ලෝකයෙහි යථාර්ථය හඳුනාගැනීමට විචාරශීලීත්වය මග පෙන්වයි.

## විචාරශීලී ග්‍රාහකයෙකු සතු විය යුතු කුසලතා

**01 විශ්ලේෂණය**

මාධ්‍ය සන්දේශයක අන්තර්ගතව ඇති හෝ සංයෝග වී ඇති ද්‍රව්‍ය අංශයන් වෙන් කිරීම.
යම් සන්දේශයක් තේරුම් ගත හැකි ආකාරයෙන් කො- ටස් වලට වෙන් කිරීම.
මාධ්‍යයක් මගින් අප වෙත ලැබෙන සන්දේශයක් හෝ තොරතුරු ඒ අයුරන්ම පිළිගැනීමට හෝ එම තොරතුරු වෙන් වෙන් වශයෙන් ගැඹුරින් ඒවායේ අර්ථ අනුව කොටස්වලට වෙන්කර ඒවා ඉදිරිපත් වී ඇති ආකාරය විභාග කිරීම.

**02 තක්සේරුකරණය**

මාධ්‍ය සන්දේශයෙහි ගුණ හා අගුණ සොයා බලමින් තක්සේරුකරණය කිරීම.
ප්‍රවෘත්තියක නැතිනම් තොරතුරක යෝග්‍යතාව හෝ අයෝග්‍යතාව තක්සේරු කිරීම.

**03 කාණ්ඩකරණය**

මාධ්‍ය සන්දේශය කාණ්ඩවලට බෙදා වෙන් කර ගැනීම
තොරතුරක නැතහොත් ප්‍රවෘත්තියක එන කරුණු වල සමාන අසමාන කොටස් සංසඳනය කිරීම මෙයින් අදහස් කෙරේ.

**04 අනුමානය**

අනුමානය කරමින් මාධ්‍ය සන්දේශයෙහි ඇතුළත් දේ අනුව සිතාබලා සමස්ත රටාව පිළිබඳ අනුමාන කිරීම.
කුඩා කරුණු ප්‍රමාණයක විද්‍යාමාන වන රටාව හඳුනාගෙන ඊට වඩා විශාල කරුණු ප්‍රමාණයක පොදු රටාව හඳුනා ගැනීමයි.



එවැනි තොරතුරු තෝරා ගැනීම් කිරීම සඳහා කුසලතා අවශ්‍ය වේ මෙම කුසලතා පුද්ගලයන්ගේ උපකරණ නැතහොත් මෙවලම් බවට පත්වේ.

**කුසලතා**

කුසලතා නැතහොත් මාධ්‍ය සමත්කම් අපට ලැබෙන්නේ යම් ක්‍රියාවක නිතර යෙදී ඒ පිළිබඳව පළපුරුද්දක් ලබා ගැනීමෙනි.

මාධ්‍ය කුසලතා වශයෙන් මාධ්‍ය විශ්ලේෂණය
තක්සේරුකරණය කාණ්ඩවලට බෙදා ගැනීම අනුමාන කිරීම, විග්‍රහාත්මක බව, නව ප්‍රස්තුත ගොඩ නැගීම, අනවශ්‍ය දේ බැහැර කරමින් නිගමන වලට එළඹීම ,සන්දේශයක අඩංගු ප්‍රධානතම දේවල් පැහැදිලි ලෙස සංස්ලේෂණය කිරීම සහ සාරාංශ කර ගැනීම ආදී කරුණු දැක්විය හැකිය.

මාධ්‍ය සාක්ෂරතාවය යනු සන්නිවේදන මාධ්‍ය මගින් නි- රන්තරයෙන් ගලා එන සන්දේශ නැතහොත් තොරතුරු වලට අප නිරාවරණය හෝ විවෘත වෙද්දී එම සන්දේශ ක්‍රියාකාරීව අර්ථ නිරූපණය කර ගැනීම සඳහා උපයෝගී කර ගත හැකි පර්යාලෝක කට්ලයකි.

මාධ්‍ය සාක්ෂරතාවය විවිධ මාන වලින් යුක්ත වේ.

**01 සංජානන තොරතුරු**

පොත් පුවත්පත් සගරා ලිපි වල කියවෙන කරුණු.

**02 චිත්තවේගී තොරතුරු**

ආදරය, සබකෝලය, සතුට, වෛරය, කෝපය, සතුට හා කනගාටුව කනස්සල්ල සතුටු වු අවස්ථා බියට පත්වු අවස්ථා සබකෝලය අත්දුටු අවස්ථාවේ හැගීම්.

**03 සෞන්දර්යාත්මක තොරතුරු**

කෙලෙස යම් සන්දේශයක් තොරතුරක් නිර්මාණය කළ යුතුද යන්න කියා දෙයි.මෙම මානයෙන් අප මනින මිනුම් දඬු භාවිතයෙන් හොඳ ලේඛකයන් ඡායාරූප ශිල්පී- න් පසුතල සපයන්නන් ගායකගායිකාවන් හඳුනාගන හැකිය.

**04 සදාචාරාත්මක තොරතුරු**

නොයෙකුත් වටිනාකම් පිළිබඳ තොරතුරු අපට ලබා දෙයි.අප සිත් තුළ හෝ හෘද සෘක්ෂිය තුළ තිබන මිනුම් දඬු ආශ්‍රිතව ගොඩ නැගුණු තොරතුරු මේ ගණයට අයත්වේ.

මාධ්‍ය සාක්ෂරතාවයේ ප්‍රයෝජන

**ඩබ්ලිව් ජේම්ස් පොටර් කරුණු 03 ක් දක්වයි.**

01 විවිධ මාධ්‍ය පණිවිඩ ලබා ගැනීමේ කැමැත්ත වැඩිවීම.
02 අපගේ මානසික චර්යා පද්ධතිය පාලනය කර ගැනී-මේ හැකියාව.
03 මාධ්‍ය පාලනය කිරීමට බලයක් ලැබීම.

**01 විවිධ මාධ්‍ය පණිවිඩ ලබා ගැනීමේ කැමැත්ත වැඩිවීම.**

මාධ්‍යවල බලපෑම්වලට යටත් නොවී මාධ්‍ය සාක්ෂරතා-වය සහ ඥාන ව්‍යුහයන් සංඛ්‍යාව වැඩි දියුණු කර ගැනී-මෙන් ගුණාත්මක බවෙන් ඉහළ මාධ්‍යයන් පරිශීලනයට යොමු කිරීම.

**02 අපගේ මානසික චර්යා පද්ධතිය පාලනය කර ගැනීමේ හැකියාව.**

මාධ්‍යකරුවන්ට අපගේ ආකල්ප හා සිතුම් පැතුම් කෙ-රෙහි මැදිහත්වීමට ඇති හැකියාව අවම කරවීම.

**03 මාධ්‍ය පාලනය කිරීමට බලයක් ලැබීම.**

මාධ්‍ය හිමිකරුවන්ගේ ග්‍රහණයෙන් ගැලවී ස්වාධීන ව තමන්ට යෝග්‍ය මාධ්‍ය තෝරා ගැනීමට බලයක් පුද්ගලයාට ඇති කර දීම.

**මාධ්‍ය සාක්ෂරතාවයේ ලක්ෂණ.**

පුද්ගලයකුගේ මාධ්‍ය සංක්ෂරතාවය ඔහුගේ පර්යා ලෝක ගණන වැඩිවීමෙන් වර්ධනයවේ.
මාධ්‍ය සාක්ෂරතාවය ප්‍රභේද අනුව වර්ග කළ නොහැක. එහි විවිධ පැතිකඩ ඇත.

මාධ්‍ය සාක්ෂරතාය වැඩි දියුණු කර ගත හැක්කේ සංජානන දැනුම හැඟීම් වින්දනයෙන් ලැබෙන දැනුම සෞන්දර්යාත්මක මානයෙන් ලැබෙන දැනුම හා සදාචාරාත්මක වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ප්‍රගුන කිරීමෙන් ලැබෙන දැනුම සංකලනය වීමෙනි.

මාධ්‍ය සෘක්ෂරතාවය ස්ථර තුනක් මත ගොඩ නැගේ. එනම් ස්ව කේන්ද්‍රය පුද්ගලයකු සතු ඥාන ව්‍යුහ කට්ටල ගණන හා ඔහු ඇති කර ගන්නා සමත්කම් හා නොහොත් කුසලතා මතයි.

උසස් මාධ්‍ය සාක්ෂරතාවයක් සහිත පුද්ගලයන් තමා හමුවේ ඇති සන්දේශ තුළ අඩංගු දේ විනිවිද දකියි.

ගුණාත්මක සන්දේශ පමණක් තෝරා බේරා ගනියි.

**මාධ්‍ය විචාරය**

විචාරය යනු යම් දෙයක අගය විශ්ලේෂණය කිරීමයි.

මාධ්‍ය විචාරය යනු
ඕනෑම ආකාරයක මාධ්‍යයක් මගින් ඉදිරිපත් වන ඕනෑම ස්වරූපයක සන්දේශ විග්‍රහ කර ගැනීම අර්ථකථනය කර ගැනීම සහ අගය කිරීමයි.



**මාධ්‍ය හා සංස්කෘතිය**

සංස්කෘතික අවබෝධය මාධ්‍ය විචාරයට අත්‍යවශ්‍ය වේ සංස්කෘත්න්හි පවතින විවිධාකාර බව(ජනප්‍රිය ඉහළ සහ පහළ ප්‍රභූ ජන) අනුව ඒ එක් සංස්කෘතීන් සමග මාධ්‍ය සිදු කරනු ලබන ගණුදෙනුව වෙනස් වේ.

රූපවාහිනිය සමාජීය වෘත්තීය ලිංගික සමාජ පන්ති ජාතිය වාර්ගිකත්වය පිළිබිඹු කරන හැඩගස්වන සමාජීය ආයතනයක් වේ.

ඒකාකෘති/ධනාත්මක හා සෘණාත්මක සංස්කෘතික වටිනාකම්/වැඩසටහන් තුළින් සිදු කරන බලපෑම ආදිය විචාරයට ලක් කිරීම වැදගත් වේ.

**මාධ්‍ය හා මායාව**

මායාව යනු මිත්‍යාවයි.
මාධ්‍යය සන්දේශ සංජානනය කිරීමේ දී පුද්ගලයන් වැරදි අත්විදිනවා නම් ඒවා මිත්‍යාවන්ය.

සන්දේශ විකෘති කොට මිත්‍යා ජනමත ගොඩනගනු ලබයි.

සත්‍ය හෝ අසත්‍ය දෙයක් මාධ්‍ය මගින් කාලයක් විසුරුවා හරින විට ඒවා සත්‍ය ලෙස පිළි ගැනීමට ලක් වේ.

වෙළඳ දැන්වීම් වල පෙළ හා රූප මගින් මිත්‍යාව ජනනය කරයි.
කාන්තාව හා අලංකාරය අතර මිත්‍යාව හඳුනා ගැනීම විචාරයේ දී සිදු කළ යුතුය.

**විචාරශීලී ග්‍රාහකයා**

සක්‍රීය ග්‍රාහකයෙකි.
සක්‍රීය ග්‍රාහකයා තොරතුරු ලැබෙන්නේ කෙසේද? කාගෙන්ද? කොහෙන්ද? යන්න විමසයි .
විශ්වාස කළ හැකි මූලාශ්‍ර වලින් තොරතුරු ලැබේදැයි සැම විටම විමසයි.
මාධ්‍ය වලින් ලැබෙන සන්දේශ ඒ ආකාරයෙන්ම භාර නොගැනීමටත් ඒවා පිළිබඳව ප්‍රශ්න කිරීමටත් යොමුවේ.

**විචාරශීලී ග්‍රාහකත්වය කෙරෙහි බලපාන සාධක.**

ජනමාධ්‍ය සහ ඒවායේ ග්‍රාහකයන් පිළිබඳව තොරතුරු ලබා ගැනීමෙන් ලැබෙන බලගැන්වීම පිළිබඳව හැදෑරීම.

ප්‍රධාන ජනමාධ්‍ය මගින් ලැබෙන තොරතුරු මෙන් විකල්ප ජනමාධ්‍ය මගින් ලැබෙන තොරතුරු ලබා ගැනීමේ වැදගත්කම හා අභියෝග හඳුනා ගැනීම.

ග්‍රාහක නිර්මාණ ජනමාධ්‍යයන්ට ලබාදීමේ අභියෝග ජය ගැනීම.

**මාධ්‍ය විචාරයේ කාර්යයන්**

නිර්මාණාත්මකව සන්දේශ පැහැදිලි කිරීම.
ආකෘතිය විශ්ලේෂණය කිරීම.
එහි ඇති අගයන් විමර්ශනය කිරීම.

**විචාරයේ දී වැදගත් වචන මූලික කරුණු**

සන්දේශයේ තේමාව.
එහි පවතින ආශ්වාදය. ( රසය)
ග්‍රාහක අවබෝධය සඳහා නිර්මාණය තේරුම් ගැනීම.
එකී නිර්මාණය හෝ සන්දේශය ජීවිතයට වැදගත්වන ආකාරය විග්‍රහ කිරීම.

**මාධ්‍ය විචාරයේ අවශ්‍යතාවය.**

මාධ්‍ය වහල්භාවයෙන් පුද්ගලයා මුදවා ගැනීමට.
මාධ්‍යට හසුවී පුද්ගලයාගේ දෛනික ජීවිතයට සිදු කරන බලපෑමෙන් මිදීමට.
ග්‍රාහක විශ්වාස සදාචාරවලට අහිතකර ලෙස සිදු කරන බලපෑමෙන් මිදීමට.

**මාධ්‍ය සහ විවිධ දෘෂ්ටිවාද (මාධ්‍ය විචාර දෘෂ්ටිවාද)**

මාධ්‍ය හා දෘෂ්ටිවාද යන්නෙන් අදහස් කරන්නේ මාධ්‍ය විචාරයට විවිධ දෘෂ්ටිවාද ගණනාවක් මග පෙන්වන්නේය යන්නයි.

මාක්ස්වාදී විචාරය
මනෝ විශ්ලේෂණ විචාරය
ස්ත්‍රීවාදී විචාරය

**මාක්ස්වාදී විචාරය**

ධනේෂ්වර සමාජයේ අවශ්‍යතා වරප්‍රසාදලත් සහ පවත්න බල ව්‍යුහයන් ශක්තිමත් කිරීම සඳහා මාධ්‍ය නිෂ්පාදන පවතින බව විග්‍රහ කරයි.

මාධ්‍ය මගින් ග්‍රාහකයාට විවිධ දේ පැවැරීම පතුරවා හැරීම හා පරාවර්තනය කිරීම පිළිබඳව විශ්ලේෂණය කරයි.

මාධ්‍යවල පවත්නා ආර්ථික හා සංස්කෘතික පදනමත් බලය හා මුදල් ඉලක්ක කොට මාධ්‍ය නිර්මාණ බිහිවීම විශ්ලේෂණය කරයි.

ධනය හා බලය පිළිබඳ අසමතුලිතතාව සහිත සමාජීය ආයතන මාධ්‍ය විසින් ශක්තිමත් කරනු ලබන ආකාරයත් මාධ්‍ය ආධිපත්‍යය මගින් පවත්වාගෙන යනු ලබන ආකාරය විශ්ලේෂණය කරයි.



**මාධ්‍ය ආර්ථිකයට අයත් දෑ**

මාධ්‍ය සමාගමක් යනු කුමක්ද?
එහි අභිප්‍රේරණය කුමක්ද?
ඊට අදාළ තරගකාරී වෙළඳපොළ කුමක්ද?

**මාධ්‍ය හා තාක්ෂණය.**

ඒ ඒ මාධ්‍යයන්ට අදාල තාක්ෂණය මෙහිලා අවධානයට ගැනේ.

විවිධ මාධ්‍යන්ට සම්බන්ධ තාක්ෂණය
මුද්‍රිත මාධ්‍ය - මුද්‍රණ තාක්ෂණය
රූපවාහිනිය - විද්‍යුත් සම්ප්‍රේෂණ තාක්ෂණය
නව මාධ්‍ය - සංඛ්‍යාංත තාක්ෂණය ( ඩිජිටල්)

**නව මාධ්‍ය තාක්ෂණය**

නූතන සමාජයේ තාක්ෂණය හා මාධ්‍ය භාවිතයෙන් සිදුවන සමාජ අසම්තුලිතතාව සහ සමාජ විපරිණාමය පිළිබඳ දැනුවත් වීමට මෙම මාධ්‍ය තාක්ෂණය විමසීම වැදගත්වේ.

නව මාධ්‍ය තාක්ෂණය හැසිරවීමේ උපරිම නිදසක් පුද්ගලයා සතු වේ පෞද්ගලිකත්වයක් සහිතව තාක්ෂණය භාවිතා කළ හැකි වේ.

නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය තුළ පවත්නා වීඩියෝ පරිගණක ක්‍රීඩා ගීත ඡායාරූප කතා ආදී විවිධ කලාත්මක දෑ හුවමාරු කර ගන්නා තාක්ෂණය පිළිබඳව විමසීම වැදගත්වේ.

**නිගමන**

විවිධ සාමාජීය දෘෂ්ටිකෝණ මගින් මාධ්‍ය සහ තාක්ෂණය විශ්ලේෂණය කර සාකච්ඡා කිරීම වැදගත් බව.

මානව සමාජයේ අන්තර් ක්‍රියාකාරීත්වය උපන්න වී ඇති අයුරු හඳුනා ගැනීමට තාක්ෂණයේ බලපෑම විමසිය යුතු බව.

වර්තමානයේ තාක්ෂණය නවීන සමාජයන් හා දෛනික ජීවිතයක් බවට පරිවර්තනය කිරීම විමසිය යුතු බව.

විශේෂිත කාලවලදී විශේෂිත වූ තාක්ෂණික බලපෑම් හා ඒවායේ විශේෂිත ක්‍රියාකාරීත්වය පිළිබඳව විමසිය යුතු බව.

**මාධ්‍ය හා දෛනික ජීවිතය**

මාධ්‍ය පුද්ගල දෛනික ජීවිතය කෙරෙහි බලපෑමක් සිදු කරයි.
පුද්ගලයා මාධ්‍ය සමග නිරන්තර සම්බන්ධතා පවත්-වයි.

**මාධ්‍ය හා දෛනික ජීවිතය (අහිතකර ප්‍රතිඵල)**

සන්දේශවල ගුණාත්මතාවය කෙරෙහි අවධානය යොමු නොකිරීම.
ලිංගිකත්වය හා ප්‍රචණ්ඩත්වය බහුලවීම.
මත්ද්‍රව්‍ය හා මත්පැන් සහිත දර්ශන බහුලව ප්‍රදර්ශනය කිරීම.
හානිකර ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.
ක්ෂණික ආහාර පුරුදු ඇති කිරීම.

**මාධ්‍ය සහ සන්දේශයන්හි සම විෂමතා**.

මාධ්‍ය සන්දේශයන්හි සම විෂමතා හඳුනාගත හැකි ප්‍රශ්න.

සන්දේශය කුමක්ද?
එය නිර්මාණය කළේ කාටද?
එය නිර්මාණය කළේ කවුද?
කුමණ අරමුණකින්ද?
කුමණ මාධ්‍යයකින්ද?

**මාධ්‍ය සන්දේශ ආධිපත්‍යය**.

සමාජ සංස්කෘතික වටිනාකම් හා චින්තනය කෙරෙහි බලපවත්නා මාධ්‍ය බලයයි.

පුවත්පත් සඟරා රූපවාහිනිය ගුවන්විදුලිය අන්තර්ජාලය මෙලෙස අධිපත්‍යය දරන ආයතන ලෙස හඳුනාගත හැකිය.

ආර්ථික දේශපාලනික සංස්කෘතික ආදී බලවේග මත අධිපත්‍ය බිහිවේ ධනවතුන් හා බලවතුන් යොදා ගන්නා ධනේෂ්වර උපකරණයකි.

දේශපාලනික හා ව්‍යාපාරික පාර්ශ්ව විසින් මෙහෙ-යවනු ලබන බැවින් ඒ ඒ බලයන්ට යටත්ව මාධ්‍ය සන්දේශ ගොඩනැගේ.

**මාධ්‍ය ආර්ථිකය**

මාධ්‍ය ආර්ථිකය යනු පසුගිය වසර 40 පුරා සැලකිය යුතු වර්ධනයට ලක්ව ඇති අධ්‍යනය ක්ෂේත්‍රයකි මාධ්‍ය කර්මාන්තය මත ගොඩ නැගෙන මාධ්‍ය ආර්ථිකය වෙළඳ දැන්වීම්කරුවන් ග්‍රාහකයා හා මාධ්‍ය අතර නව සම්බන්ධතාවයකි.



**මනෝ විශ්ලේෂණ විචාරය**

මනෝවිද්‍යාත්මක න්‍යායන් ඔස්සේ මාධ්‍ය සන්දේශ අවධානයට ගැනීම සිදු කරයි ළදරුවන් නොසන්සුන් කිරීමට මාධ්‍ය බලවත් බලපෑම් කරන බව මතයකි.

වෙළඳ දැන්වීම් මූලික සිහිකල්පනාවන්හි සැඟවුණු සිතිවිලි වලට ආමන්ත්‍රණය කරන බව දක්වයි.
සංකේතාත්මක මාධ්‍ය භාවිතවන්හි යටි අරුත් විමසීම සිදු කරයි.
වාණිජ සන්නිවේදන අවස්ථා හඳුනා ගැනීම සිදු කරයි
මාධ්‍ය සිදු කරන චිත්තවේගී බලපෑම විග්‍රහ කරයි.
දැන්වීම්වල පුනරුක්තිය (නැවත නැවත පෙන්වීම) සිදු කරන බලපෑම විග්‍රහ කරයි.

පූර්ව අත්දැකීම් මාධ්‍ය ඇසුරු කිරීමේ දී බලපාන ආකාරය විග්‍රහ කරයි.

මාධ්‍ය ඇසුර මගින් ගොඩනැගෙන අන්තර්වර්ති සහ අන්තර් පුද්ගල සම්බන්ධතා පිළිබඳව විමසයි.

මනංකල්පිත ජීවිත වලට තල්ලුකිරීමට මාධ්‍ය ක්‍රියාකාරකම් හේතුවන ආකාරය විමසයි..

**ස්ත්‍රීවාදී විචාර ප්‍රවේශය**.

ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳව ලිංගිකත්ව සමානතා පදනම මත සිට විචාරය කරයි.
මාධ්‍ය තුළ කාන්තාවන් අවප්‍රමාණවන ආකාරය විග්‍රහ කරයි.
ජනමාධ්‍ය තුළ කාන්තාවන් අවප්‍රමාණ කිරීමට පවතින බලය විග්‍රහ කරයි.
මාධ්‍ය මගින් කාන්තාවන්ට එරෙහිව සිදු කරන වෙනස්කම් විග්‍රහ කරයි.
මාධ්‍ය තුළ කාන්තාව ඒකාකෘතික ලෙස නිරූපණය කිරීම විග්‍රහ කරයි.

ස්වභාවික ස්ත්‍රීන් මාධ්‍ය තුළ දක්නට නොලැබීම විග්‍රහ කරයි.
මව්වරුන් භාර්යාවන් දියණියන් පෙම්වතියන් ලිංගික භාණ්ඩ ලෙස නිරූපණය කරන ආකාරය විග්‍රහ කරයි.
ස්ත්‍රීත්වය පිළිබඳ වටිනාකම් බෙදා හැරීමට මාධ්‍ය වල දායකත්වය විග්‍රහ කරයි.
කාන්තා ගැටළු මාධ්‍ය මගින් විකෘති කිරීම විග්‍රහ කරයි.